# ශ්‍රී ලංකාවේ ගුරුවිද්‍යාලයීය පුහුණු (සිංහල මාධ්‍යය) පාඨමාලාවට අයත් විෂය නිර්දේශයේ වෘත්තීය අධ්‍යාපන ඛණ්ඩය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති

( M.Phil ) උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධනය.

1987.


පී.එම්.යූ.පතිරාජ

1981/M.Phil/20.

අධ්‍යාපන පීඨය,

ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලය,

කොළඹ 03.


1987 මැයි. 01.

## සංක්ෂිප්තය.

### ගැටළුවේ වැදගත්කම.

විධිමත් අධ්‍යාපන කාර්යයේ මූලික අත්තිවාරම දැමීමේ නියමුවන් පුහුණු ගුරුවරුය. පාසල් ජනගහණයෙන් 63% ක් ප්‍රාථමික අංශයේ සිසුන්ය. ජාතික අවශ්‍යතාවන් සපුරාලනසේ අධ්‍යාපන පරමාර්ථ මුදුන්පත් කිරීමේ ආරම්භය ප්‍රාථමික අධ්‍යාපනයේදී සිදුවේ. ප්‍රාථමික පාසලේ අංශ ප්‍රධානීන් හා විදුහල්පති වරුන් ලෙස කටයුතු කරන්නේද පුහුණු ගුරුවරුන්මය. පාසල් ජනගහණයෙන් 30% ක් පමණ වන 7-11 වසර සිසුන්ගේ අධ්‍යාපනික කටයුතුවලද වැඩි වගකීමත් පුහුණු ගුරුවරුන් සතුමය. මේ රටේ මුළු ගුරු සංඛ්‍යාවෙන් 55% පුහුණු ගුරුවරු වෙති. එනිසා පුහුණු ගුරුවරයා සතු කාර්යභාරය සපුරාලීමට සමත් කාර්ය බද්ධ ප්‍රවීණතාවක් ගුරුපුහුණු පාඨමාලා තුළින් ලැබේදැයි විමසා බැලීම ඉතාම කාලෝචිතය. තුන් අවුරුදු ගුරුපුහුණු පාඨමාලාවේ වෘත්තීය අධ්‍යාපන ඛණ්ඩයට අයත් අධ්‍යාපන මූලධර්ම, අධ්‍යාපන මනෝවිද්‍යාව, ප්‍රායෝගික ඉගැන්වීමේ පුහුණුව පිළිබඳ විෂය නිර්දේශයන් ආශ්‍රයෙන් වර්තමාන පර්යේෂණය සැලසුම් වී ඇත. එබැවින් මෙම පර්යේෂණයේ ප්‍රතිඵල හා ඒ ආශ්‍රිත යෝජනා ගුරු පුහුණු පාඨමාලා සංශෝධනයන් සඳහා බෙහෙවින් උපකාර වනවා පමණක් නොව ඒ පිළිබඳ පෙළඹවීමකටද හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම ගුරුවිද්‍යාල වලින් අපේක්ෂිත සේවාවේ ගුණාත්මක වර්ධනයක් කෙරෙහි අවධානයත්, ගුරුසේවාවේ ගුණාත්මක වර්ධනය සඳහා නව මං විමසීමේ අවශ්‍යතාව කරා යොමුවීමත් ඉටුවනු ඇතැයි විශ්වාස කළහැකිය.